# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2241/24 – 2021 අගෝස්තු 17 වැනි අඟහරුවාදා – 2021.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරිය පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, යටවත්ත නමැති ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/YTT/2019/450 හා 2020.03.05 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර A වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.7302ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'A' – යටවත්තවත්ත – ප්‍රමාණය: හෙක්. 0.7302

උතුරට: උඩුපුස්සැල්ලාව වැවිලි සමාගම හිමිකම් කියන යටවත්තවත්ත සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.) සහ උඩුපුස්සැල්ලාව වැවිලි සමාගම හිමිකම් කියන යටවත්තවත්ත; දකුණට: උඩුපුස්සැල්ලාව වැවිලි සමාගම හිමිකම් කියන යටවත්තවත්ත සහ මාර්ගය; බටහිරට: උඩුපුස්සැල්ලාව වැවිලි සමාගම හිමිකම් කියන යටවත්තවත්ත.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/17/2019/LO/162.
2021 මාර්තු මස 25 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 490




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*